රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 34/92

රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

1992 දෙසැම්බර් මස 14 වෙනි දින.

අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභාවල ප්‍රධාන ලේකම්වරුන්,
දිසාපතිවරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන්
ආණ්ඩුකාරවරුන්ගේ ලේකම්වරුන් සහ
ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත.

**<u>ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 12:5:4 සහ</u>**
**<u>12:6:1 උප වගන්ති සංශෝධනය කිරීම.</u>**

ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 12:5:4 සහ 12:6:1 උප වගන්ති පහත සඳහන් පරිදි සංශෝධනය කිරීමට අමාත්‍ය මණ්ඩලය තීරණය කර ඇත.

" 12:5:4 – නිලධාරියෙකු ස්ථිර තනතුරක් දරන අතරතුර දී තවත් තනතුරක වැඩ බලන්නේ නම් ඔහුට මෙහි පහත සඳහන් අන්දමට ගෙවිය යුතුය.

තනතුරු දෙකෙහිම සම්පූර්ණ රාජකාරි ඉටු කිරීමට ඔහුට නියම වී ඇත්නම්, ඔහු වැඩබලන තනතුරට අයත් ආරම්භක වැටුපෙන් දෙකෙන් එකක් ද සමඟ ඔහුගේ නිත්‍ය තනතුරට අයත් සම්පූර්ණ පාරිශ්‍රමිකය, තනතුරකට වැටුපක් නියම කර නොමැති අවස්ථාවල දී 1/2 කට සමාන වැටුප කල්පිත වැටුපක් විය යුතු අතර, එය තීරණය කළ යුත්තේ ඒ සඳහා පත්වීම් බලධාරියාගෙන් ඉල්ලීමක් ලැබීමෙන් අනතුරුව, භාණ්ඩාගාරයේ ලේකම්ගෙන් විමසා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම් විසිනි. "

"12:6:1 වැඩ බලන නිලධාරියා 12:5:4 වැනි උප වගන්තියේ සඳහන් ගණයට අයත් වන්නේ නම්, ගෙවිය යුතු මුදල, අතිරේක තනතුරේ ආරම්භක වැටුපෙන් 2/1ක මුදල නොඉක්මවිය යුතුය. "

02. මෙය 1992.01.01 වැනි දින සිට ක්‍රියාත්මක විය යුතු බැව් දන්වමි.

03. මේ අනුව ආයතන සංග්‍රහයේ අදාල උප වගන්ති සංශෝධනය කරනු ලැබේ.

අ.කලේ/ (එම්.එන්.ජුනයිඩ්),
ලේකම්,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.